# කෘෂිකර්මයේ අභියෝග හා විසඳුම්



සරත් ප්‍රනාන්දු

# කෘෂිකර්මයේ අභියෝග හා විසඳුම්

අද රටේ ගොවි ජනතාවත්, අඩු ආදායම් ලබන පාරිභෝගික ජනතාවත් මුහුණ පා සිටින ප්‍රධාන අභියෝගයන් ජයගත හැක්කේ කෘෂිකර්මය අඩු වියදම්, ස්වභාවික කෘෂිකර්මය බවට හැරවීමෙනි.

මෙය ශ්‍රී ලංකාවේ සෑම ක්ෂේත්‍රයකට කෘෂිකර්මයේ දී කළ හැකිවුන්, කළයුතුවුත් ප්‍රධාන කාර්යයක් වන අතර, එය අප රටේ ජනතාව මුහුණ දෙන සෙසු අභියෝග රාශියක් ජයගත හැකි මාර්ගයක්ද වේ.

මෙම පරිවර්තනය ශ්‍රී ලංකාව ඇතුලු ලෝකයේ සෙසු සියලු ඝර්ම කළාපීය රටවල ඉතා පහසුවෙන් කළ හැකි කාර්යයක් වන අතර එය මේ සියලු රටවල උග්‍රවෙමින් ඇති ආහාර, සෞඛ්‍යය හා පෝෂණය, දිළිඳුභාවය, වෙළඳාම් හා ආර්ථික සමාජීය විෂමතාවයන් පිළිබඳ අර්බුදයන් මෙන්ම පාරිසරික, ගෝලීය උණුසුම හා කාළගුණ විපර්යාසයන් පිළිබඳ අර්බුදයන් ද, තෘෂ්ණාව හා ලාභ රැස් කිරීම කරා යොමු වූ සමාජය තුළ පවතින සමාජ අර්බුදයන් ද විසඳීම සදහා හොඳම ප්‍රවේශයක් වනු නියතය.

මිනිසා සහ සොබාදහම අතර තිබිය යුතු සබඳතාවය වන්නේ, මිනිසා විසින් හැකි තරම් සොබා දහමෙන් උදුරා ගැනීම සඳහා සොබාදහමේ ක්‍රියාකාරිත්වයට බාධක පනවමින්, එහි තිබිය යුතු ප්‍රති උත්පාදන හැකියාව විනාශ කරමින් රැස්කිරීම අධික පාරිභෝජනය හා නාස්තිය වැඩි කිරීම නොවේ. සොබාදහමේ ස්වාභාවික ක්‍රියාකාරිත්වය ද එහි ඇති අති විශිෂ්ට ව්‍යාත්මක භාවය ද වටහා ගනිමින් ඊට අනුකූලව හා එකඟව ක්‍රියා කිරීමයි.

මෙය ඉතිහාසයේ ඉතා දිගු කලක් පුරා නොසළකා ක්‍රියා කිරීම නිසා ඇති වී තිබෙන හානි විකෘතී වීම් හා විනාශයන් යළි නිවැරදි කිරීමත් ඒ මගින් සොබා දහමේ තිබිය යුතු ප්‍රතිඋත්පාදන හැකියාව යළි ගොඩනැගීමත් අද මානව වර්ගයා වෙත පැවරී ඇති කාර්යයකි. එසේ කිරීමට ලෝකය අපොහොසත් වුවහොත් හෝ ප්‍රමාද වුවහොත් දැනට ඇති දුප්පත්කම, සාගින්න, ආහාර විෂවීම, සෞඛ්‍ය පිරිහීම, ජලය හා පරිසරය අපවිත්‍ර වීම හා හිඟවීම ආදි ප්‍රශ්න තව තවත් උග්‍ර වනවා ඇත. සමස්ත මිහිතලය මිනිසා හා සෙසු ජීවින්ට අහිමි වන

ඉහත කාරණා පිළිබඳ මනා ගැඹුරු අවබෝධයෙන් යුතු ගොවි ව්‍යාපාරයක් දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම අවශ්‍යව තිබේ. එබඳු ව්‍යාපාරයක් ගොඩ නැගිය හැක්කේ කාටද ? කෙසේද ? එවැන්නකට මුල පිරිය යුත්තේ කවුද ? එයට සහය කර ගත යුත්තේ කවුද ? යනාදි ප්‍රශ්න විසඳා ගැනීම අවශ්‍යය.

මේ කරුණු විසඳා ගැනීම සඳහා මෙතෙක් ඉතිහාසය පුරා ගමන් ගත් මඟ, කෘෂිකර්මය, ආහාර නිෂ්පාදනය, වෙළෙඳාම හා භූමිය, ජලය, වනාන්තර, බීජ ආදි ස්වාභාවික සම්පත් පාවිච්චි වූ ආකාරය ගැන විමසා බැලීම කළ යුතුය. එසේ විග්‍රහ කිරීම තුළින් අපට වෙනස් කළ යුත්තේ මොනවාද ? ප්‍රතික්ෂේප කළ යුත්තේ මොනවාද ? රැක ගත යුත්තේ මොනවාද? ගොඩනැගිය යුත්තේ මොනවාද? යනාදිය වටහා ගත හැකි වේ.

තමා වගාකරන භූමිය, තමා ජීවත්වන පරිසරය කෙසේ දියුණු කළ යුතුද යන්න මෙන්ම තම ප්‍රදේශයේ, රටේ, කළාපයේ හා ලෝකයේ වෙනස් කළ යුත්තේ මොනවාද යන්න පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. මෙය එකින් එක පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා වන අධ්‍යාපන පාඨමාලාවක් තම ගොවි සංවිධානයන් තුළද , තරුණ ජනයා අතර ද, සෙසු සමාජය තුළද, ගොඩනැගීම කාගේත් වගකීම විය යුතුය.

එය පහත සඳහන් විෂයන් අනුව සකසා ගත හැක.

01. අඩු වියදම් ස්වාභාවික කෘෂිකර්මය යනු කුමක්ද ?
අද ප්‍රචලිතව කෙරෙන කෘෂිකර්මය එයින් බැහැරවී ඇත්තේ කෙසේද ?

02. ස්වාභාවික කෘෂිකර්මයේදී උපයෝගී කොට ගත යුතු නොමිලේ ලැබෙන සාදකඃ
1. හිරු එළිය හා එහි උපරිම ඵල ලබා ගැනීම සඳහා ගස්, ශාඛ ප්‍රමාණය වැඩි කිරීම -
ස්ථර වගාව
2. පසෙහි ස්වාභාවික සාරවත් භාවය, මතුපිට පස සංරක්ෂණය
3. ජෛව විවිධත්වය මගින් පළිබෝධ හානි අඩු කර ගැනීම.
මේ සඳහා පසෙහි පෝෂණ තත්ත්වය විවිධ කිරීම.
4. කාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය, සත්ව හා ශාඛ අපද්‍රව්‍ය යෙදීම, ජීවා මෘත, දියර පොහොර, කාබනික පොහොර

5. බීජ සංරක්ෂණය -
ස්වාභාවික බීජ රැස් කිරීම හා දෙමහුන් බීජ හා ජාන වෙනස් කළ බීජ පාවිච්චියේ හානිය
6. ඒකාබද්ධ ස්වාභාවික පළිබෝධ පාලනය හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය -
පස පෝෂණය කිරීමේදී ක්ෂුද්‍ර ජීවීන්ගේ දායකත්වය
7. රසායනික කෘමි නාශක, වල් නාශක හා රසායනික පොහොර භාවිතයේ හානි -

- ස්වාභාවික පාලනය බිඳ වැටීම, වඩා ශක්තිමත් පළිබෝධකයින් බිහිවීම, ස්වාභාවික පොහොරකරණය බිඳ වැටීම
- රෝග බෝ වීමට පසේ දුබලතාවයන් බලපෑම, ජීව මෘත හා කාබනික පොහොර බලපාන්නේ කෙසේද ?

8. වනාන්තරයක ස්වාභාවික කෘෂිකර්මය සිදුවන ආකාරය

3. ස්වාභාවික කෘෂිකර්මය බිඳ වැටුන ආකාරය

- කැළෑ එළි කිරීම හා ඒක බෝග වගාව ව්‍යාප්ත වූයේ කෙසේද ? වාණිජ කෘෂිකර්මය ව්‍යාප්ත වීම,
- ඝර්ම කළාපයේ රටවල් හා සෙසු රටවල් අතර සබඳතාවය කෘෂිකර්මයේ ජාත්‍යන්තර ව්‍යාප්තිය
- කෘෂිකාර්මික බහුජාතික සමාගම් ව්‍යාප්ත වීම
  යටත් විජිත කරණය - පෙරදිග ඉන්දියානු වෙළෙඳ සමාගම්, යුනිලීවර් සමාගම,
  බෲක් බොන්ඩ්, ලිප්ටන් වැනි සමාගම්
- බටහිර රටවල වාණිජ කෘෂිකර්මය ව්‍යාප්ත වීම හා යාන්ත්‍රීකරණය - ඛණිජ ඇසුරෙන් නිපදවන යෙදවුම් ව්‍යාප්ත වීම - රසායනික පොහොර, කෘෂි රසායන
- බීජ ආධිපත්‍ය බහුජාතික සමාගම් අතට පත්වීම, හරිත විප්ලවය, එහි ආරම්භය හා ව්‍යාප්ත කළ ආකාරය
- අද ලොව පුරා බිහි වී ඇති කෘෂිකාර්මික, පාරිසරික හා ආහාර අර්බුද
- ලාභ රැස් කිරීම මුල්කොට ගත් බහු ජාතික සමාගම් වලට මෙම අර්බුද විසඳිය නොහැක්කේ ඇයි ?

- ගැට් ගිවිසුම (GAT), ලෝක වෙළෙඳ සංවිධානය (WTO), වෙළෙඳාම හා සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ ගිවිසුම් (TRIFS)
- ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව ආදියේ කාර්යයන්

04. දෙමුහුන් බීජ, ජාන තාක්ෂණය, ජාන කොල්ලය, හා කෘෂි බහුජාතික සමාගම් වල ආධිපත්‍ය

05. කෘෂි බහුජාතික සමාගම් - CIC, සින්ජෙන්ටා, මොන්සැන්ටෝ, CARGILL, ෂෙල් සමාගම් ආදිය

06. ජාන වෙනස්කළ ආහාර හා කෘෂිකර්මය ව්‍යාප්ත කිරීමට අද දරන උත්සාහයන් -
    - ඉන්දියාවේ BT කපු, BT වම්බටු, ආදිය නිසා ඇති වන අර්බුද - 1992 සිට මේ දක්වා 150,000 කට වැඩි සංඛ්‍යාවක් ගොවීන් සිය දිවි නසාගෙන ඇත.
    - දෙවැනි හරිත විප්ලවය නමින් Golden Rice ව්‍යාප්ත කිරීම - අප්‍රිකාවේ සාගින්නට විසඳුමක් ලෙස

07. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය හා සැලැස්ම වෙනස් වූ ආකාරය හා වෙනස් කළ යුතු ආකාරය
    - සමස්ත පද්ධතිය
    - කුඹුරු වගාව
    - ගොඩ ඉඩම් වගාව
    - වතුකරය - තේ, පොල් වතු ආදිය
    - ඉඩම් අයිතිය ආශ්‍රිත ප්‍රශ්න

08. මහජන සැලැස්මක් ගොඩ නැගිය හැක්කේ කෙසේද ?

09. රටේ සමස්ත සංවර්ධන මාවත කුමක් විය යුතුද ?

10. අධ්‍යාපනය, සෞඛ්‍යය, ධීවර මාර්ග හා රැකියා, පරිසරය හා ස්වාභාවික සම්පත් පිළිබඳ විසඳුම්

11. පාරිසරික කෘෂිකර්මය සඳහා වන ලෝක ව්‍යාප්ත ව්‍යාපාරයන්

- ල වියා කම්පසීනා ව්‍යාපාරය (La Via Campasena)
- ලතින් ඇමෙරිකානු රටවල පාරිසරික කෘෂිකර්මය ව්‍යාප්තිය
- 21 සිය වසේ කෘෂිකර්මය පිළිබඳ දර්ශනය ( Agenda 21)
- ඉන්දියාවේ - Zero Budget Natural Farming ව්‍යාපාරය
- IAASTD ''සංවර්ධනය සඳහා කෘෂිකර්ම දැනුම විද්‍යාව හා තාක්ෂණය යොදවා ගැනීම'' පිළිබඳ ජාත්‍යන්තර තක්සේරුව 2008 අප්‍රියෙල් විාංඥයින් 400 ක් විසින් අවුරුදු 4 ක් ලොව පුරා කළ අධ්‍යයනයකි.
- මිහිතලය රැක ගැනීම පිළිබඳව බොලිවියානු ප්‍රකාශනය.
- පාරිසරික කෘෂිකර්මය පිළිබඳ ශ්‍රී ලංකාවේ අත්දැකීම්.

**සරත් ප්‍රනාන්දු**
**මෙහෙයුම්කරු**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**